අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකා.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. } ED/04/60/01/වා.ස්.මා - 2022 ඔබේ අංකය / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2022.12. 29

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,

**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම - 2022 / 2023</u>**

2022 / 2023 වර්ෂයට නියමිත වාර්ෂික ස්ථාන මාරුවීම් 2023.01.20 වන දිනට ක්‍රියාත්මක වන පරිදි අනුමත කර එම නියෝග අධ්‍යාපන අමාත්‍යාංශයේ http:/www/moe.gov.lk වෙබ් අඩවියේ පළකර ඇත. අදාළ ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳ නියමිත නිලධරයන්ට දන්වා, ඔවුන්ට නව සේවා ස්ථාන වල නියමිත දින වැඩ භාර ගැනීමට හැකිවන පරිදි එම නිලධාරීන් පෙර සේවා ස්ථානයෙන් නිදහස් කරලීමට හා ඔවුන් වෙනුවට පැමිණෙන නිලධරයන් වෙත නව සේවා ස්ථානවල වැඩ භාර ගැනීමට හැකි වන පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරු කිරීම් සිදු කර ඇත්තේ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 06/2022 හි සඳහන් පටිපාටියට අනුකූල වන අතර තම මාරු ඉල්ලීම් පිළිබඳ වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේ අවධානය යොමු වී නැත්නම් පමණක් එම නිලධරයන්ට අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

03. අභියාචනා ඉල්ලුම්පත්‍රයෙහි ආදර්ශයක් (ඇමුණුම 02) මේ සමඟ අමුණා ඇති අතර ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අභියාචනා ඉල්ලුම්පත් 2023.02.10 දිනට ප්‍රථම මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි. ස්ථාන මාරු ලේඛනයේ අදාළ නිලධරයට ලබා දී ඇති අනු අංකය අභියාචනා ඉල්ලුම් පත්‍රයේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර 2023.02.10 දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවට ද අදාළ නිලධරයන්ට දැන්විය යුතු වේ.

04. නිලධාරීන් විසින් අභියාචනා ඉදිරිපත් නොකරන්නේ නම් විධිමත් පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස් වී ස්ථාන මාරුව ක්‍රියාත්මක වන 2023.01.20 දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගෙන විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මේ සමඟ අමුණා ඇති (ඇමුණුම 03) අනුව විදුහල්පති ශාඛාව වෙත දැනුම් දිය යුතු වේ.

05. ඔබ පළාතේ හෝ ජාතික පාසලේ සේවයේ නියුතු ඉන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන්, <u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u> නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීමට හැකිවන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වමි.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

අමාත්‍යතුමා / அமைச்சர் / Hon. Minister } +94112784832 · +94112784825 · minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } +94112784811 · +94112785162 · secretary.education@moe.gov.lk

CS CamScanner